# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 ශ්‍රේණිය



18 පාඩම

මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා

## 9.0 නිපුණතාව

සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

## 9.3 නිපුණතා මට්ටම

දේශාභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි.

## ක්‍රියාකාරකම 01

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. දේශාභිමානය යනු කුමක් ද?

..............................................................................................................

2. යම් අයෙකුගේ හදවතෙහි දේශාභිමානී හැඟීම් පහළ වීමට කුමන කරුණු හේතු වන්නේ ද?

..............................................................................................................

..............................................................................................................

3. 'මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා' ගීතයේ රචකයා නම් කරන්න.

..............................................................................................................

4. 'ලංකා ලංකා පෙම්බර ලංකා' ගීතයේ රචකයා කවුද?

.......................................................................................................

5. 'රත්නදීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි' ගීතයේ රචකයා නම් කරන්න.

.......................................................................................................

6. 'සසර වසන තුරු නිවන් දකින තුරු' ගීතයේ රචකයාගේ නම කුමක් ද?

.......................................................................................................

## ක්‍රියාකාරකම 02

- මෙම වාක්‍යවලට සුදුසු අනතීත කාල ආඛ්‍යාත පද යොදන්න.

1. දියණියෝ දෙමාපියන්ට උවටැන් ...........................
2. යහපත් දරුවෝ ගුරු දෙගුරුන් ...........................
3. ගුරුතුමිය අපට අකුරු ...........................
4. බුදුහු නිවනට මාවත පෙන්වා ...........................
5. සිටුතුමා රජ මාලිගයට ...........................

## ක්‍රියාකාරකම 03

- මෙම වාක්‍යවලට සුදුසු අතීත කාල ආඛ්‍යාත පද යොදන්න.

1. දියණියෝ දෙමාපියන්ට  උවටැන් ..........................
2. යහපත් දරුවෝ ගුරු දෙගුරුන්  ..........................
3. ගුරුතුමිය අපට අකුරු  ..........................
4. බුදුහු නිවනට මාවත පෙන්වා  ..........................
5. සිටුතුමා රජ මාලිගයට ..........................

## ක්‍රියාකාරකම 04

- පහත සඳහන් ඉඟි වැකිවල අදහස වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

1. අනූනවයෙන් බේරුණා - ........................................................
2. අත මාරුවක් ඉල්ලනවා - ........................................................
3. අර අඳිනවා - ........................................................
4. අහසේ මාලිගා හදනවා - ........................................................
5. ඇඹිබැහි වෙනවා - ........................................................
6. කොළේ වහල ගහනවා - ........................................................
7. බෙරිහන් දෙනවා - ........................................................
8. නිවී හැනහිල්ලෙ ඉන්නවා - ........................................................

(පුරුදු වෙනවා, සූදානම් වෙනවා, විවේකයෙන් ඉන්නවා, යන්තමින් බේරුණා, ණය මුදලක් ඉල්ලනවා, ඇත්ත හංගා වැඩ කරනවා, මහ හඬ නගනවා, සිහින මවනවා)

## ක්‍රියාකාරකම 05

### (5) සුදුසු පරිදි විධි ක්‍රියා පද යොදා හිස්තැන් පුරවන්න.

1. දෙවියනි, අපට සහනයක් දැන්වත් ලබා ....................................
2. " .................................... සුළඟේ ඔබ කොයි සිටදෝ එන්නේ"
3. නිශ්ශබ්ද ව පන්තියට ....................................
4. සියලු සත්ත්වයින්ට ආදරය ....................................
5. " .................................... මේ වේයා - ලොකු සතකු නොවේ යා"
6. හොඳ ළමයින් මෙන් ....................................
7. "අයන්න .................................... ලොවට ම ඇහෙන්න."
8. "දැං ගෙඩියට හිස ......................" යි වධකයා මද්දුම බණ්ඩාරට කීය.

**ක්‍රියාකාරකම 01 - පිළිතුරු**

1. දේශය පිළිබඳ ආඩම්බරය, ගර්වය, මානය යන්න යි.
2. තම මාතෘ භූමියේ සංස්කෘතික උරුමයත්, අතීත සෞභාග්‍යය මෙන් ම ස්වභාව සෞන්දර්යය පිළිබඳ අසන්නට ලැබීමෙන් සෑම පුරවැසියෙකු තුළ ම දේශාභිමානී හැඟීම් පහළ වීම නියත ය.
3. කරුණාරත්න අමරසිංහ මහතා
4. අරිසෙන් අහුබුදු මහතා
5. මහගම සේකර මහතා
6. ඩෝල්ටන් අල්විස් මහතා

## ක්‍රියාකාරකම 02 - පිළිතුරු

1. දියණියෝ දෙමාපියන්ට උවටැන් කරති / කරන්නෝ ය.

2. යහපත් දරුවෝ ගුරු දෙගුරුන් නමදිති / නමදින්නෝ ය.

3. ගුරුතුමිය අපට අකුරු උගන්වයි / උගන්වන්නී ය.

4. බුදුහු නිවනට මාවත පෙන්වා දෙති / දෙන්නෝ ය.

5. සිටුතුමා රජ මාලිගයට යයි / යන්නේ ය.

## ක්‍රියාකාරකම 03 - පිළිතුරු

1. දියණියෝ දෙමාපියන්ට උවටැන් කළහ / කළෝ ය.
2. යහපත් දරුවෝ ගුරු දෙගුරුන් නැමදූහ / නැමදුවෝ ය.
3. ගුරුතුමිය අපට අකුරු ඉගැන්වූවා ය.
4. බුදුහු නිවනට මාවත පෙන්වා දුන්හ / දුන්නෝ ය.
5. සිටුතුමා රජ මාලිගයට ගියේ ය.

## ක්‍රියාකාරකම 04 - පිළිතුරු

1. අනනුවයෙන් බේරුණා - යන්තමින් බේරුණා
2. අත මාරුවක් ඉල්ලනවා - ණය මුදලක් ඉල්ලනවා
3. අර අඳිනවා - සූදානම් වෙනවා
4. අහසේ මාලිගා හදනවා - සිහින මවනවා
5. ඇබ්බැහි වෙනවා - පුරුදු වෙනවා
6. කොළේ වහල ගහනවා - ඇත්ත හංගා වැඩ කරනවා
7. බෙරිහන් දෙනවා - මහ හඬ නගනවා
8. නිවී හැනහිල්ලෙ ඉන්නවා - විවේකයෙන් ඉන්නවා

# ක්‍රියාකාරකම 05 -පිළිතුරු

1. දෙවියනි, අපට සහනයක් දැන්වත් ලබා දෙනු මැනවි.
2. " කියන්න සුළඟේ ඔබ කොයි සිටදෝ එන්නේ"
3. නිශ්ශබ්ද ව පන්තියට පැමිණෙන්න.
4. සියලු සත්ත්වයින්ට ආදරය කරන්න.
5. "බලනු මේ වේයා - ලොකු සතකු නොවේ යා"
6. හොඳ ළමයින් මෙන් හැසිරෙන්න.
7. "අයන්න කියන්න ලොවට ම ඇහෙන්න."
8. "දං ගෙඩියට හිස තබනු" යි වධකයා මද්දුම බණ්ඩාරට කීය.

සැකසුම - මහේන්ද්‍ර මද්දේගම
චන්ද්‍රරතන විද්‍යාලය, කැලණිය